CSS/7/6/3/2/2013 2013.11.25

දකුණු පළාතේ සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ,

**<u>සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දිනවල වැඩ කිරීම වෙනුවෙන් සමහර ශ්‍රේණි වලට මුදල් ගෙවීම</u>**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2013.10.09 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ආයතන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ 10.1 උප වගන්තිය සංශෝධනය කර ඇත.(එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

02. එම චක්‍රලේඛය දකුණු පළාත් සභාව සඳහා ද අදාළ කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලැබී ඇති බව කාරුණිකව දැනුම් දෙමි.

03. ඒ අනුව දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්වරුන් සහ එම මට්ටමේ නිලධාරීන් සඳහා රජයේ නිවාඩු දින හා සති අන්තයන්හි මසකට දින 02ක් සේවය කිරීමට පූර්ව අනුමැතිය ප්‍රධාන ලේකම් වෙතින් ලබාගත යුතු අතර, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ සෙසු මාණ්ඩලික නිලධාරීන් සති අන්ත හා රජයේ නිවාඩු දින 02 ක් සේවයේ යෙදීම සඳහා පූර්ව අනුමැතිය පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ආණ්ඩුකාර ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හා සභා ලේකම් වෙතින් අදාළ පරිදි ලබාගත යුතුය.

04. මසකට දින 02ක් ඉක්මවා සති අන්ත හා රජයේ නිවාඩු දින සේවයේ යෙදීමට අවශ්‍ය වන අවස්ථාවක පළාත් සභාවේ සියළුම විධායක නිලධාරීන් සඳහා ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.මසකට දින දෙක ඉක්මවා අනුමත කරනු ලබන්නේ අත්‍යාවශ්‍ය හා කල්දැමිය නොහැකි හදිසි රාජකාරී කටයුතු සඳහා බැවින් අදාළ අයදුම්පත්‍රය සමග එම විස්තර පැහැදිලිව සඳහන් කළ යුතුය. එමෙන්ම අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍ර නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් කරන ලෙසද දන්වමි.(ආකෘති පත්‍රයේ පිටපත අමුණා ඇත)

ඩබ්.කේ.කේ.අතුකෝරල
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් : 01. ප්‍රධාන ලේකම් කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් -දැ.ගැ.ස.